# ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව - 2017

**නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය**

## විධායක සාරාංශය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ රජයේ ගොඩනැගිලිවල සැලසුම් සහ ඉදිකිරීම් සම්බන්ධව වග කියන ප්‍රමුඛ රජයේ ආයතනය ලෙස දශක 5කට ආසන්න කාලයක් කටයුතු කරමින් සිටී. මේ වන විට, වෙනස් වෙන ආර්ථිකයට සහ තාක්ෂණයට ගැලපෙන ලෙස සංවර්ධනය කර ඇති රජයේ දෙපාර්තමේන්තු අතුරින් එකක් වීමට අප ආයතනය සමත් වී ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික වගවීම වෙත විශේෂ අවධානයක් යොදවමින් දෙපාර්තමේන්තුව තම වගකීම සහ මෙහෙවර ප්‍රකාශය ප්‍රති අර්ථකථනය කර ගෙන යනු ඇත.

මෙම කාර්ය සාධන වාර්තාව සකසා ඇත්තේ වැඩි දියුණු වූ කාර්ය සාධනය සඳහා ඉලක්ක සැකසීම, ශ්‍රම බලකාය අධීක්ෂණය, පාලනය සහ සමාලෝචනය, අනුකූලතාව ප්‍රදර්ශනය කිරීම, බාහිර වාර්තා සැකසීම, කාර්ය සාධනය වැඩි දියුණු කිරීම, සහ ඉංජිනේරුවරුන්, සේවාදායකයින් සහ කොන්ත්‍රාත්කරුවන් අතර සන්නිවේදනය වැඩි දියුණු කිරීම යන අරමුණු සහිතවය.

අතීත කාර්ය සාධනය හා සාපේක්ෂව ගත් විට 2017 වසරේ කාර්ය සාධනය ඇගයිය යුතු මට්ටමක පවතින අතර ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ව්‍යාපෘති ගණනද වැඩි වී ඇත. කලාප 7 තුළම ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සාරාංශගත කර ඇත. පුනරාවර්තන වියදම්වල සහ ප්‍රාග්ධන වියදම්වල සාරාංශය මගින් පෙන්වන පරිදි අනෙකුත් සමාන ආයතනවලට සාපේක්ෂව, නිමැවුම පිරිවැය ඵලදායී වන අතර කාර්යක්ෂමද වේ.

වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය එහි ඉලක්කයට සාපේක්ෂව ගත්විට ගිවිසුම් කාලය තුළ ඉලක්කයට ළඟා වී ඇති අතර කාර්ය සාධනය සහ වැඩ ගුණාත්මක බව වැඩි කිරීමට සමාලෝචනයද සිදු කරයි. විවිධ වෘත්තිකයින්ගෙන් සමන්විත දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය, ලැබී ඇති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ඉහළ සේවාවන් ලබාදෙයි. උපරිම කාර්යක්ෂමතාවක් තුලින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව උත්සාහ දරයි. විවිධ බාහිර සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කර ගෙන යනු ලබයි. වාර්ෂික විගණන සැලසුම අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් පරිපාලනය, මූල්‍ය සහ වෙනත් කටයුතු විගණනය සිදු කරන ලදී

වර්තමාන අවශ්‍යතාවයන් සම්බන්ධව කටයුතු කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් නැවත සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳව අධ්‍යයනයක් අවශ්‍ය වූ අතර අනාගතයේදී රජයට සම්බන්ධ සියලු ව්‍යාපෘති භාර ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

## පටුන


- හැඳින්වීම ........ 3
  - සංස්ථානික තොරතුරු ........ 3
  - දැක්ම ........ 4
  - මෙහෙවර ........ 4
  - තත්ව ප්‍රතිපත්තිය ........ 4
- අධිකාරිය සහ වගකීම ........ 5
- දෙපාර්තමේන්තුවේ සහතිකය ........ 5
- කළමනාකාරීත්ව ධූරාවලිය ........ 6
- සපයන සේවාවන් ........ 7
- කලාප කාර්යාල ........ 9
- අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය ........ 10
- 2017 දක්වා අතීත කාර්ය සාධනය ........ 11
- 2017 වසරේ ව්‍යාපෘති වල සාරාංශය ........ 13
- උපදේශක අංශයේ කාර්ය සාධනය ........ 14
- අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය - 2017 ........ 15
- ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2017 ........ 15
- වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය - 2017 ........ 18
- යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන - 2018 ........ 19
- කලාපීය කාර්ය සාධනය ........ 20
  - කලාප 1 - ඉදිකිරීම් ........ 20
    - කාර්ය සාධනය ........ 20
    - සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 20
  - කලාප 1 - නඩත්තුව ........ 21
    - කාර්ය සාධනය ........ 21
    - සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 21

- කලාප 2 ........ 22
    - කාර්ය සාධනය ........ 22
    - සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 22
- කලාපය 3 ........ 23
    - කාර්ය සාධනය ........ 23
    - සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 23
- කලාප 4 ........ 24
    - කාර්ය සාධනය ........ 24
    - සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 24
- කලාප 5 ........ 25
    - කාර්ය සාධනය ........ 25
    - සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 25
- කලාපය 6 ........ 26
    - කාර්ය සාධනය ........ 26
    - සම්පූර්ණ කළ ව්‍යාපෘති ........ 26

➢ මානව සම්පත් ........ 27

➢ මානව සම්පත්-ශක්තිය ........ 28

- සේවක සංඛ්‍යාව ........ 28
- ධාරිතා සංවර්ධනය ........ 29

➢ ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය ........ 32

- අභ්‍යන්තර විගණන අංශය ........ 32

➢ විගණකාධිපති වාර්තාව ........ 34

## හැඳින්වීම


රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 5 ක පමණ කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස පවතී. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය සහ උපදේශක ආයතනය වෙයි. ගොඩනැගීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස ද එය කැඳවීම කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරීත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනභිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේ දී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහ ගත කෙරිණි. ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ISO 9001:2008 තත්ව සහතිකය ද ලබා ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික වගවීම වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථ කථනය කරයි.

## සංස්ථානික තොරතුරු

| | | |
|---|---|---|
| **නම** | - | ගොඩනැගිලි දෙපාර්තමේන්තුව |
| **නෛතික තත්ත්වය** | - | පූර්ණ රාජ්‍ය ආයතනයකි |
| **අමාත්‍යාංශය** | - | නිවාස හා ඉදිකිරීම් |
| **කාර්යාලය** | - | දෙවන මහල |
| | | "සෙත්සිරිපාය", බත්තරමුල්ල |
| | | ශ්‍රී ලංකාව |
| | | දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771 |
| | | විද්‍යුත් තැපැල dgb@buildingsdept.gov.lk |
| | | අන්තර්ජාල ලිපිනය www.buildingsdept.gov.lk |




*රූපය 1: ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම*

දැක්ම

මෙහෙවර

තත්ව ප්‍රතිපත්තිය

## දැක්ම

ජනතාවට විශිෂ්ඨ සේවාවක් ලබාදීම පිණිස සුරක්ෂිත වූද, පිරිමැසුම් දායක වූද, තිරසාර හා විශිෂ්ඨ ලෙස නිමවූ ගොඩනැගිලි පරිසරයක් රාජ්‍ය අංශ ආයතන වලට ලබා දෙමින් ගොඩනැගිලි තාක්‍ෂණයේ ප්‍රමුඛයා බවට පත්වීම.

## මෙහෙවර

තාක්‍ෂණික වගකීම, ගුණාත්මක භාවය, පිරිමැසුම්දායක බව, අපේක්‍ෂිත ගුණාංග හා තිරසාර බව සාක්ෂාත් කරමින් තම සේවා දායකයින් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි නිපුණ, එසේම තත් කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණ ද ඉදිකිරීම්, නඩත්තු කිරීම්, ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්‍ෂණික උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවක් සැපයීම.

## තත්ව ප්‍රතිපත්තිය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, රාජ්‍ය අංශයේ ගොඩනැගිලි වැඩි දියුණු කිරීම සඳහා විශිෂ්ඨ සේවයක් සැපයීමට වගකීව යුතු මූලික රාජ්‍ය ආයතනය ලෙස;

- සේවාදායක අවශ්‍යතාවය සපුරමින් ඔවුන් තෘප්තිමත් කිරීම.
- ව්‍යවස්ථාපිත, නියාමන අවශ්‍යතාවයන් සහ අදාල සම්මතයන්ට අනුගත වීම.
- පසුවිපරම් කිරීම, ප්‍රතිපෝෂණයන් හා දැනුම් හැකියාව යාවත්කාලීන කිරීම තුලින් අපගේ සේවා සැපයීම වැඩිදියුණු කිරීමෙහිලා නිරන්තර යොමු කිරීම.
- විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයන්ගේ කැලපීම තුලින් සම්පූර්ණ දායකත්වය ලබාදීම.
- ISO 9001:2008 තත්ව කළමනාකරණ ක්‍රමවේදයේ අවශ්‍යතාවයන්ට අනුකූල වීම හා එය නිරන්තරව වැඩිදියුණු කිරීම.

අධිකාරිය සහ වගකීම

# අධිකාරිය සහ වගකීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.

1. *රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම, ඇස්තමේන්තු සෑදීම, ඉදිකිරීම් සහ අදාළ පහසුකම් සැපයීම.*
2. *ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම.*
3. *රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම*
4. *රජයේ රෝහල්වල පල්දෝරු පද්ධති මෙහෙයුම හා නඩත්තුව හා එහි මනා ක්‍රියාකාරීත්වය තහවුරු කිරීම.*
5. *රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු*
6. *දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.*
7. *විදේශ දූත ව්‍යාපෘති.*

අපගේ බැඳියාවන් සමග වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මඟින් එකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.

සහතිකය

*වටිනාකම "ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, තාක්ෂණික සහ මූල්‍යමය වගවීම පිළිබඳ වගකීම දැරීම මඟින් සේවාදායකයා මුහුණ දෙන අවදානම අඩු කරන අතර ඔවුන් සිදුකරන ඉදිකිරීමට වටිනාකමක් සහතික කර සේවාදායකයාට ජීවිත කාලරක්ෂිතයක් ලබා දීමයි.*

# දෙපාර්තමේන්තුවේ සහතිකය

සේවාදායකයාගේ තාක්ෂණික සහ කළමනාකරණ ධාරිතාව සලකා බලමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සක්‍රිය සහයක් ලබාදෙනු ලැබේ. ඉදිකිරීම් සඳහා සහතිකයක් ලබාදීමට ඇති අවශ්‍යතාවය අපි අගය කරන අතර පහත ක්‍රියාමාර්ග තුළින් අවදානම අඩු කරගැනීමට වගකියන්නෙමු:

a. *යාවජීව තාක්ෂණික/මූල්‍ය වගවීම*
b. *සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා බලයලත් ඉහළම වෘත්තිකයන් වෙතින් සැලසුම්*
c. *සියලුම රීති,රෙගුලාසි සහ තත්ව හා ආරක්ෂක ප්‍රමිතීන් අනුගමනය කිරීම*
d. *අතීත අත්දැකීම් භාවිතා කරමින් විශේෂයෙන් සංවර්ධනය කළ අති නිරවද්‍ය විෂය පථය*
e. *අනෙකුත් සේවා සපයන්නන්ගේ සැලසුම්, ලේඛන යනාදිය පරීක්ෂා කර තත්ත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම*
f. *කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම*
g. *අත්දැකීම්ලත් වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ සේවය මඟින් වටිනාකම් කර දීම*
h. *කළමනාකරණ විගණනවල මතුවන ගැටළුවලදී සහය ලබාදීම*
i. *ගිවිසුම්ගත නීතිමය කටයුතුවලදී සහය ලබාදීම*
j. *තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගි වී තාක්ෂණික සහය ලබාදීම*

## කළමනාකාරීත්ව ධූරාවලිය

කළමනාකාරීත්ව ධූරාවලිය

| | | |
|---|---|---|
| ඉංජි.එම්.ආර්. ජෙයවන්දුන් | - | අධ්‍යක්ෂ ජනරාල් |
| ඉංජි.එම්.එච්.එම්.ඉස්මයිල් | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) |
| (පුරප්පාඩු) | - | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශක සේවා) |
| එස්.ඩී.ඩී.පී. සිංහපුර මහත්මිය | - | අධ්‍යක්ෂ (පාලන) |
| ටී.සී. මහානාම මහත්මිය | - | ප්‍රධාන ගණකාධිකාරී |
| ඉංජි ඩබ්ලිව්.ඒ.ඩබ්ලිව්. අබයවර්ධන මහත්මිය | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 1) |
| ඉංජි. ඒ. නවාස් ආදම් | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 2) |
| ඉංජි කේ.ජී. සන්ධ්‍යා කුමුදිනී මහත්මිය | - | අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 3) |
| ඉංජි. ජී.එච්. හිරිමුතුගොඩ මහත්මිය | - | අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ) |
| එස්. නරසිංහ මෙනවිය | - | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| වාස්තු විද්‍යාඥ කේ.බී. මේනක මංගලනාථ | - | වැඩ බලන අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) |

## සපයන සේවාවන්

*ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවා දායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීමේ ලා ඇති වෙන ධාරිතා පරතරය පිරවීමට කටයුතු කරයි.*

**ව්‍යාපෘති යෝජනා** (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනා ගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, සම්භාව්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබා දීම අපි සිදු කරන්නෙමු.

**කාර්ය නිෂ්ඨාව** (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා අපි සම්පූර්ණ වගකීම භාර ගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය යතුර යෙදීම පමණි.

මූල්‍ය රෙගුලාසි වල දක්වා ඇති පරිදි, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු චෙක් පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අරමුදල් නිකුත් කෙරේ.

**උපදේශනය** (ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛණකරණය කරනු ලබන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සපයනු ලැබේ. මෙහිදී ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**ව්‍යාපෘති කළමනාකරණය (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ/උපදේශක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)**

කොන්ත්‍රාත් ආයතනය වෙත උපදේශනය සැපයීමේ වගකීම අප විසින් ගනු ලැබේ. මෙහිදී ක්‍රියාත්මක කිරීමට භාරගැනීම හෝ ඒ සඳහා සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. BOT (ඉදිකිරීම, මෙහෙයවීම හා පැවරීම), BOOT (ඉදිකිරීම, හිමිකරගැනීම, මෙහෙයවීම සහ පැවරීම) යටතේ පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන් සහ රජයේ හෝ ප්‍රදායක නියෝජිතායතනවල සැළසුම් සහ ගොඩනැගීම් කොන්ත්‍රාත් අප විසින් භාරගනු ලැබේ.

මෙය මඟින් අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

**නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම් (කාර්ය භාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)**

තත්ව වාර්තා සැකසීම, නඩත්තු කාර්ය සංග්‍රහයන් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.

සපයන සේවාවන්


සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිදහස් කළ යුතුය.

**ලබාදෙන වෙනත් සේවාවන්.**

අනෙක් ආයතනවල තාක්ෂණික ඇගයීම් කමිටුවල සාමාජිකයින් ලෙස සමර්ථ නිලධාරීන් පත්කර ඒ සඳහා සහභාගි වෙනු ලැබේ.

සපයන සේවාවන්

## කලාප කාර්යාල




*රූපය 2: කලාප බෙදීමේ සිතියම*

**"ගොඩනැගිලි දෙපාර්තමේන්තුව දීපව්‍යාප්ත ස්ථාන 6ක පිහිටි කලාප කාර්යාල හතක් හරහා සේවාදායකයින්ට සේවාවන් ලබාදෙයි."**

## අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

**ජාතික සංවර්ධනයට දායකත්වය**

අප දෙපාර්තමේන්තුව ඉදිකිරීම් අංශය තුළින් සම්පූර්ණ වශයෙන්ම රටේ සංවර්ධන කටයුතු වලට දායකත්වය සපයමින් දීප ව්‍යාප්ත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් ලබාදීමට දෙපාර්තමේන්තුවට සමත්විය.

**ISO 9001:2008 තත්ව සහතිකය ලබා ගැනීම**

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රධාන ඉංජිනේරු (කලාප 5) කාර්යාලය ISO 9001:2008 ක්‍රියාත්මක කරනු ලබයි.

අනෙකුත් කලාප කාර්යාල ද ISO තත්වය ලබා ගැනීම සඳහා අදාළ ලේඛන සූදානම් කර ගෙන යයි.

**ප්‍රගති සාරාංශය**


2017 වසර තුළ ඉලක්කගත අගයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 73% කි.

**2017 වසර තුළ මුහුණ දුන් බාධකයන්**

- කාර්ය මණ්ඩලයේ හිඟකම
  - ඉංජිනේරුවන් සහ වාස්තු විද්‍යාඥයින්
  - කාර්මික නිලධාරීන් සහ සැලසුම් ශිල්පීන්
  - රාජ්‍ය කළමනාකරණ සහකාර සහ සංවර්ධන නිලධාරි
  - රියදුරන්
- පහසුකම් සහ ප්‍රතිලාභ මඳ හෙයින් රජයේ සේවය තුළ නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුකම
- වැඩ බිම් වෙත යාම සඳහා වාහන අඩුකම
- හදිසි ව්‍යාපෘති සඳහා පැවරුම් කිරීමේ පදනම මත උපදේශක සේවා ලබා ගැනීමේ අනුමැති නොමැති වීම
- සංචාරක බංගලා නඩත්තුව/නභාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා ගෙවීම් නොකිරීම (සැලසුම් සම්පූර්ණ කිරීමෙන් පසු)
- ඉදිකිරීම් අදියර තුළ සේවාදායකයන් විසින් කරනු ලබන වෙනස් කිරීම් නිසා ව්‍යාපෘති ප්‍රමාද වීම
- කොන්ත්‍රාත්කරුවන්ගේ සම්පත් මදකම නිසා කලට වේලාවට ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ අසීරුතාව
- සේවාදායකයින් විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ හා පළාත් පාලන අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන්


**ඉංජි. එම්. ආර්. ජයචන්ද්‍රන්**
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්

## 2017 දක්වා අතීත කාර්ය සාධනය




| | January | February | March | April | May | June | July | Aug | Sep | Oct | Nov | Dec |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 2017 Progress | 331.3 | 699.28 | 1097.25 | 1455.83 | 1803.5 | 2086.59 | 2467.36 | 2815.93 | 3230.29 | 3687.04 | 4221.53 | 5262.4 |
| 2017 Target | 689.1 | 1439.6 | 2258.41 | 1756.33 | 2621.93 | 3476.25 | 2710.4 | 3668.73 | 4619.92 | 4624.77 | 5762.53 | 7202.39 |

*රූපය 3: පසුගිය වසරවල් සමග ඉදිකිරීම් සන්සන්දනය*





| | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|---|---|---|
| Rehabilitation | 212.92 | 206.90 | 142.09 | 158.08 | 344.80 | 363.13 | 603.43 | 502.77 |
| New Buildings | 303.5 | 426.05 | 479.03 | 1181.14 | 1178.21 | 1940.68 | 3313.95 | 4759.63 |
| Total | 516.42 | 632.95 | 621.12 | 1339.22 | 1523.01 | 2303.81 | 3917.38 | 5262.40 |

*රූපය 4: පසුගිය සත් වසර සමග සන්සන්දනය*

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රජයේ ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව වෙතින් සපයන ප්‍රධාන සේවාවන් නම, නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම, ප්‍රතිසංස්කරණය ලෙස වර්ගීකරණය කළ හැකිය. රූපය 4 මගින් පෙන්වා දී ඇති පරිදි දෙපාර්තමේන්තුව 2010 වසරේ වූ මිලියන 516 ක කාර්ය සාධනයේ සිට 2017 මිලියන 5262 දක්වා වර්ධනය වී ඇති අතර එය 919% වැඩි වීම. 2010 වසරේ සිට 2017 දක්වා වාර්ෂික වර්ධනය 1 වගුවේ සහ 4 රූපයේ දක්වා ඇත.

*වගුව 1: 2010-2017 දක්වා වාර්ෂික වර්ධනය*

| වසර | වාර්ෂික කාර්ය සාධනය (රුපියල් මිලියන) | වර්ධනය % (පදනම් වර්ෂය 2010) | වර්ධනය % (පදනම් වර්ෂය පෙර වසර) |
|---|---|---|---|
| 2010 | 516.42 | - | - |
| 2011 | 632.95 | 23% | 23% |
| 2012 | 621.12 | 20% | -2% |
| 2013 | 1339.22 | 159% | 115% |
| 2014 | 1523.01 | 195% | 14% |
| 2015 | 2303.81 | 346% | 51% |
| 2016 | 3917.38 | 659% | 70% |
| 2017 | 5262.40 | 919% | 34% |




*රූපය 5: කාර්ය සාධනයේ වර්ධනය*

වගුව 2 මගින් දක්වා ඇති පරිදි 2016 සිට 2017 දක්වා දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය මිලියන 3917 සිට 5262 දක්වා වර්ධනය වී ඇත. පහත වගුව 2 මඟින් ප්‍රතිසංස්කරණය සහ නව ගොඩනැගිලි යන ක්ෂේත්‍රවල කාර්ය සාධනය පෙන්වයි. 2016 සිට 2017 දක්වා කාලය තුළ නව ගොඩනැගීම් 43% කින් වර්ධනය වී ඇති අතර ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති 16% කින් අඩු වී ඇත.

*වගුව 2: වාර්ෂික කාර්ය සාධනයේ ආංශික සන්සන්දනය*

| අංශය | වාර්ෂික කාර්ය සාධනය රුපියල් ( මිලියන) | | වර්ධන ප්‍රතිශතය |
|---|---|---|---|
| | 2016 | 2017 | |
| ප්‍රතිසංස්කරණය | 603.43 | 502.77 | -16% |
| නව ගොඩනැගිලි | 3313.95 | 4759.63 | 43% |
| එකතුව | **3917.38** | **5262.40** | **34%** |

## 2017 වසරේ ව්‍යාපෘති වල සාරාංශය

වගුව 3 මගින් දක්වා ඇති පරිදි 2017 වසරේදී දෙපාර්තමේන්තුව ව්‍යාපෘති 465 ක් සිදුකළ අතර ව්‍යාපෘති අගය රුපියල් මිලියන 25ට අඩු ව්‍යාපෘතීන් 310ක් ද, ව්‍යාපෘති අගය රුපියල් මිලියන 25 සහ රුපියල් මිලියන 100 අතර වන ව්‍යාපෘතීන් 90ක් ද, අගය රුපියල් මිලියන 100 සහ 200 අතර වන ව්‍යාපෘතීන් 40ක්ද, ව්‍යාපෘති අගය රුපියල් මිලියන 200 කට වැඩි ව්‍යාපෘතීන් 25ක්ද විය.

*වගුව 3: 2017 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය*


| කලාප කාර්යාලය | ව්‍යාපෘති වටිනාකම රුපියල් (මිලියන) | | | | |
|---|---|---|---|---|---|
| | 0-25 | 25-100 | 100-200 | >200 | එකතුව |
| කලාප 1 - ඉදිකිරීම් | 2 | 5 | 3 | 4 | 14 |
| කලාප 1 - නඩත්තුව | 127 | 5 | 3 | 1 | 137 |
| කලාප 2 | 14 | 18 | 3 | 5 | 40 |
| කලාප 3 | 34 | 15 | 11 | 2 | 62 |
| කලාප 4 | 59 | 17 | 10 | 6 | 92 |
| කලාප 5 | 24 | 23 | 6 | 5 | 58 |
| කලාප 6 | 49 | 7 | 4 | 2 | 62 |
| එකතුව | **310** | **90** | **40** | **25** | **465** |

## උපදේශක අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවන්ගේ අරටුව වනුයේ උපදේශන අංශයයි. මෙම අංශය විසින් ඉදිකිරීම් සහ අදාළ යටිතල පහසුකම් සඳහා වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විද්‍යුත්, ජල සැපයුම්, ජලාපවාහන සහ යාන්ත්‍රික නිමැවුම් යනාදී ආකාර වලින් සේවාවන් සහ ප්‍රමාණ පත්‍ර ද සැකසීම ද වේ. ඉහත සේවාවන් සපයනුයේ ඒ සඳහා කැපවූ වෘත්තීමය වාස්තු විද්‍යාඥයන් සහ ඉංජිනේරුවරුන් විසිනි. මෙම අංශය 2013 වසරේ රුපියල් මිලියන 2700 ක කාර්ය සාධනයක් පෙන්වූ අතර 2014 දී එය රුපියල් මිලියන 3308 ක්ද 2015 වසරේදී රුපියල් මිලියන 4342 ක්ද 2016 වසරේදී රුපියල් මිලියන 7236 ක්ද 2017 වසරේදී රුපියල් මිලියන 6646 ක්ද දක්වා වර්ධනය විය. පහත 4 වගුව 2017 වසරේ ව්‍යාපෘති ප්‍රමාණය පෙන්වන අතර 2013 සිට 2017 දක්වා කාර්ය සාධනය 5 වන රූපය මගින් නිරූපනය කෙරේ.

*වගුව 4: 2017 වසරේදී ව්‍යාපෘති උපදේශන අංශයේ සාරාංශය*


| අංකය | විස්තරය | ව්‍යාපෘති ගණන |
|---|---|---|
| 1 | සැලසුම් අදියරේදී සම්පූර්ණ කළ ව්‍යාපෘති | 47 |
| 2 | සේවාදායක අනුමැතීන් සඳහා වන දළ සැලසුම් | 103 |
| 3 | ඉදිකිරීම් අදියර සඳහා සැළසුම් සකස් කරන ව්‍යාපෘති | 16 |
| 4 | 2017 වසර අවසානයේ සැකසෙමින් ඇති දළ සැලසුම් | 03 |
| 5 | 2017 වසර අවසානයේ විමර්ශන අදියරේ පවතින ව්‍යාපෘති | 26 |
| | **මුළු ව්‍යාපෘති සංඛ්‍යාව** | **195** |
| | සැලසුම් අදියරේදී අවසන් කල ව්‍යාපෘති වල ඇස්තමේන්තු ගත මුළු වටිනාකම (රුපියල් මිලියන) | **6646** |




| | 2013 | 2014 | 2015 | 2016 | 2017 |
|---|---|---|---|---|---|
| Target (Rs. Mn) | 0 | 3240 | 3900 | 6000 | 6500 |
| Progress (Rs. Mn) | 2700 | 3308 | 4342 | 7236 | 6646 |

*රූපය 6: උපදේශන අංශයේ කාර්ය සාධනයේ ප්‍රස්තාරමය නිරූපනය කිරීම*


## අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රකාශනය - 2017




| | Max limit of Expenditure | Min limit of Receipts | Max limit of Debit balance |
|---|---|---|---|
| Estimate Limits Rs.(Mn) | 26.00 | 18.00 | 90.00 |
| Received Limits Rs.(Mn) | 26.00 | 13.50 | 90.00 |
| Actual Expenditure /Receipts Rs.(Mn) | 25.440 | 14.850 | 47.561 |

*රූපය 7: අත්තිකාරම් ගිණුමේ දක්වා ඇති සීමාවන්ගේ සත්‍ය ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම*

## ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම් - 2017




| | Capital Budget | Recurrent Budget | Total |
|---|---|---|---|
| Annual estimate (Rs.Mn) | 39.9 | 309.23 | 349.13 |
| Supplementary Provision (Rs.Mn) | 0 | 7.00 | 7.00 |
| Total (Rs.Mn) | 39.90 | 316.23 | 365.13 |
| Expenditure(Rs.Mn) | 38.91 | 315.81 | 354.72 |

*රූපය 8: ප්‍රාග්ධන සහ පුනරාවර්තන වියදම්වල ප්‍රස්තාරමය ඉදිරිපත් කිරීම*

වගුව 5: පුනරාවර්තන වියදමේ සාරාංශය

| වැය විෂය | අයිතමයේ විස්තරය | 2017 ඇස්තමේන්තුවේ ප්‍රතිපාදනය | වියදම | ශේෂය | වියදමේ % |
|---|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | | | | |
| | පුද්ගල පඩිනඩි | | | | |
| 1001 | වැටුප් සහ වේතන | 127,960,000.00 | 127,937,161.18 | 22,838.82 | 99.98 |
| 1002 | අතිකාල සහ නිවාඩු දින ගෙවීම් | 9,500,000.00 | 9,490,986.99 | 9,013.01 | 99.91 |
| 1003 | වෙනත් දීමනා | 84,980,000.00 | 84,727,279.60 | 252,720.40 | 99.70 |
| | **එකතුව** | **222,440,000.00** | **222,155,427.77** | **284,572.23** | **99.87** |
| | ප්‍රවාහන දීමනා | | - | - | |
| 1101 | දේශීය | 7,170,000.00 | 7,140,769.28 | 29,230.72 | 99.59 |
| 1102 | විදේශීය | 550,000.00 | 547,795.25 | 2,204.75 | 99.60 |
| | **එකතුව** | **7,720,000.00** | **7,688,564.53** | **31,435.47** | **99.59** |
| | සැපයුම් | | | | |
| 1201 | ලිපිද්‍රව්‍ය සහ කාර්යාල අවශ්‍යතා | 6,137,800.00 | 6,135,842.43 | 1,957.57 | 99.97 |
| 1202 | ඉන්ධන | 11,320,000.00 | 11,302,792.87 | 17,207.13 | 99.85 |
| 1203 | ආහාර සහ නිල ඇඳුම් | 256,000.00 | 256,000.00 | - | 100.00 |
| | **එකතුව** | **17,713,800.00** | **17,694,635.30** | **19,164.70** | **99.89** |
| | නඩත්තු වියදම් | | | | |
| 1301 | වාහන | 8,444,000.00 | 8,413,111.20 | 30,888.80 | 99.63 |
| 1302 | අංගන, පිරියත හා උපකරණ | 2,919,900.00 | 2,913,233.62 | 6,666.38 | 99.77 |
| 1303 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 356,300.00 | 355,678.88 | 621.12 | 99.83 |
| | **එකතුව** | **11,720,200.00** | **11,682,023.70** | **38,176.30** | **99.67** |
| | ඉදිකිරීම් සේවාවන් | | | - | |
| 1401 | ප්‍රවාහන | 5,993,400.00 | 5,993,333.33 | 66.67 | 100.00 |
| 1402 | තැපැල් සහ සන්නිවේදන | 6,146,000.00 | 6,107,676.86 | 38,323.14 | 99.38 |
| 1403 | විදුලිය සහ ජලය | 2,830,000.00 | 2,826,955.37 | 3,044.63 | 99.89 |
| 1404 | කුලී සහ දේශීය බදු | 38,350,000.00 | 38,347,887.65 | 2,112.35 | 99.99 |
| 1409 | වෙනත් | 1,480,000.00 | 1,472,733.20 | 7,266.80 | 99.51 |
| | **එකතුව** | **54,799,400.00** | **54,748,586.41** | **50,813.59** | **99.91** |
| | මාරු කිරීම් | | - | - | |
| 1506 | රාජ්‍ය සේවකයන්ගේ දේපළ ණය පොළී | 1,815,400.00 | 1,811,664.93 | 3,735.07 | 99.79 |
| | **එකතුව** | **1,815,400.00** | **1,811,664.93** | **3,735.07** | **99.79** |
| | වෙනත් පුනරාවර්තන වියදම් | | - | - | |
| 1703 | රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම | 27,200.00 | 27,186.50 | 13.50 | 99.95 |
| | **එකතුව** | **27,200.00** | **27,186.50** | **13.50** | **99.95** |
| | **මුළු පුනරාවර්තන වියදම්** | **316,236,000.00** | **315,808,089.14** | **427,910.86** | **99.86** |

*වගුව 6: ප්‍රාග්ධන වියදම්*

| වැය විෂය | අයිතමයේ විස්තරය | 2017 ඇස්තමේන්තුවේ ප්‍රතිපාදනය | වියදම | ශේෂය | වියදමේ % |
|---|---|---|---|---|---|
| **ප්‍රාග්ධන වියදම්** | | | | | |
| | **ප්‍රාග්ධන වත්කම් ප්‍රතිසංස්කරණය සහ වැඩි දියුණු කිරීම** | | | | |
| 2001 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 15,400,000.00 | 15,396,416.46 | 3,583.54 | 99.98 |
| 2002 | අංගන, පිරියත හා උපකරණ | 1,650,000.00 | 1,644,615.72 | 5,384.28 | 99.67 |
| 2003 | වාහන | 2,300,000.00 | 2,278,691.86 | 21,308.14 | 99.07 |
| | **එකතුව** | **19,350,000.00** | **19,319,724.04** | **30,275.96** | **99.84** |
| | **ප්‍රාග්ධන වත්කම් අත්පත් කරගැනීම** | | | | |
| 2102 | ගෘහ භාණ්ඩ සහ කාර්යාල උපකරණ | 1,350,000.00 | 1,343,774.21 | 6,225.79 | 99.54 |
| 2103 | අංගන පිරියත සහ උපකරණ | 12,000,000.00 | 11,933,776.92 | 66,223.08 | 99.45 |
| 2104 | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 500,000.00 | 499,100.00 | 900.00 | 99.82 |
| | **එකතුව** | **13,850,000.00** | **13,776,651.13** | **73,348.87** | **99.47** |
| | **මානව සම්පත් සංවර්ධනය** | | | | |
| 2401 | දැනුම වැඩි දියුණු කිරීම සහ ආයතනික සංවර්ධනය | 1,700,000.00 | 1,698,756.00 | 1,244.00 | 99.93 |
| | **එකතුව** | **1,700,000.00** | **1,698,756.00** | **1,244.00** | **99.93** |
| 2507 | **පර්යේෂණ හා සංවර්ධන** | 5,000,000.00 | 4,116,708.00 | 883,292.00 | 82.33 |
| | **එකතුව** | **5,000,000.00** | **4,116,708.00** | **883,292.00** | **82.33** |
| | **මුළු ප්‍රාග්ධන වියදම්** | **39,900,000.00** | **38,911,839.17** | **988,160.83** | **97.52** |
| | **මුළු ව්‍යාපෘති වියදම** | **356,136,000.00** | **354,719,928.31** | **416,071.69** | **99.60** |

## වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහනේ කාර්ය සාධනය - 2017

*වගුව: 7 කාර්ය සාධනය*

| | | කාර්ය නිෂ්ඨාව | | උපදේශනය | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තුව | | වැඩි දියුණු කිරීම | | ප්‍රතිසංස්කරණය | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % |
| කලාප 1 - ඉදිකිරීම් | ඉලක්කය | 63.16 | 100 | 601.03 | 100 | - | - | | - | - | - | | | **664.19** | **100** |
| | සත්‍ය | 49.94 | 79 | 557.51 | 81 | | | | | | | | | **607.45** | **-** |
| කලාප 1 - නඩත්තුව | ඉලක්කය | - | - | 113.20 | 100 | 155.21 | 100 | | 100 | 406.41 | 100 | | | **674.82** | **100** |
| | සත්‍ය | | | 87.00 | 80 | 138.71 | 85 | | - | 312.39 | 75 | | | **538.10** | **-** |
| කලාප 2 | ඉලක්කය | 335.07 | 100 | 443.34 | 100 | 412.79 | 100 | | - | - | - | | | **1237.30** | **100** |
| | සත්‍ය | 151.85 | 45 | 361.53 | 78 | 287.79 | 70 | | | | | | | **801.17** | **-** |
| කලාප 3 | ඉලක්කය | 544.05 | 100 | 712.97 | 100 | - | - | | 100 | - | 100 | | | **1257.02** | **100** |
| | සත්‍ය | 395.55 | 72 | 279.43 | 40 | | | | | | | | | **674.98** | **-** |
| කලාප 4 | ඉලක්කය | 583.52 | 100 | 565.71 | 100 | 178.59 | 100 | 18.26 | 100 | - | - | | | **1346.08** | **100** |
| | සත්‍ය | 610.04 | 96 | 483.85 | 82 | 139.35 | 78 | 18.26 | 100 | | | | | **1251.50** | **-** |
| කලාප 5 | ඉලක්කය | 412.74 | 100 | 551.78 | 100 | - | - | 205.51 | 100 | - | - | | | **1170.03** | **100** |
| | සත්‍ය | 239.95 | 59 | 328.26 | 59 | | | 158.69 | 76 | | | | | **726.90** | **-** |
| කලාප 6 | ඉලක්කය | 102.70 | 100 | 151.03 | 100 | 584.10 | 100 | 14.62 | 100 | - | - | 0.50 | 100 | **852.95** | **100** |
| | සත්‍ය | 77.29 | 64 | 149.78 | 59 | 421.80 | 67 | 13.12 | | | | 0.31 | 100 | **662.30** | **-** |
| එකතුව | ඉලක්කය | **2041.24** | | **3139.06** | | **1330.69** | | **238.39** | | **406.41** | | **0.50** | | **7202.39** | |
| | සත්‍ය | **1524.62** | | **2247.36** | | **978.24** | | **190.07** | | **312.39** | | **0.31** | | **5262.40** | |

## යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන - 2018


*වගුව 8: යෝජිත වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන 2018*

| | | කාර්ය නිෂ්ඨාව | | උපදේශනය | | ව්‍යාපෘති කළමනාකරණය | | නඩත්තුව | | වැඩි දියුණු කිරීම | | එකතුව | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % | මූල්‍ය (රුපියල් මිලියන) | භෞතික % |
| කලාප 1 - ඉදිකිරීම් | ඉලක්කය | 962.00 | 100 | 525.71 | 100 | - | - | - | - | - | - | 1487.71 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 1 - නඩත්තුව | ඉලක්කය | - | - | 40.00 | 100 | 147.74 | 100 | - | 100 | 387.28 | 100 | 575.02 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 2 | ඉලක්කය | 417.77 | 100 | 154.02 | 100 | 377.00 | 100 | - | - | - | - | 948.79 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 3 | ඉලක්කය | 396.00 | 100 | 1035.00 | 100 | - | - | - | - | - | - | 1431.00 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 4 | ඉලක්කය | 207.67 | 100 | 662.35 | 100 | - | - | 18.26 | 100 | - | - | 888.28 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 5 | ඉලක්කය | 441.16 | 100 | 654.94 | 100 | 81.41 | 100 | 44.48 | 100 | - | - | 1221.99 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| කලාප 6 | ඉලක්කය | 186.00 | 100 | - | - | 806.43 | 100 | 2.10 | 100 | - | - | 994.53 | 100 |
| | සත්‍ය | | | | | | | | | | | | |
| එකතුව | ඉලක්කය | **2610.60** | | **3072.02** | | **1412.58** | | **64.84** | | **387.28** | | **7547.32** | |
| | සත්‍ය | | | | | | | | | | | | |

## කලාපීය කාර්ය සාධනය

### කලාප 1 - ඉදිකිරීම්

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි.ජී.එච්.ඒ.බී. සජෝත |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි.ජී.එච්.එන්.එන්. පෙරේරා |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 1 - ඉදිකිරීම්) කාර්යාලය , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, අංක 213, ටොරින්ටන් අවන්‍යු, කොළඹ 07. |
| ☎ 94 11 554691 | ෆැක්ස් 94 11 2554690 |
| විද්‍යුත් තැපැල : cecc@buildingsdept.gov.lk | |




**කාර්ය සාධනය**

*වගුව 9: ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1 - ඉදිකිරීම්) කාර්යාලයේ හි ප්‍රගතියේ සාරාංශය*


| | කාර්ය නිෂ්පාව | උපදේශනය | එකතුව |
|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 63.16 | 601.03 | **664.19** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 49.94 | 557.51 | **607.45** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 2 | 4 | **6** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 3 | 4 | **7** |

**සම්පූර්ණ කළ ව්‍යාපෘති**

| අවිස්සාවේල්ල දිස්ත්‍රික් කම්කරු කාර්යාලය සඳහා නව කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම (අදියර 111) | | බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා යෝජිත තෙමහල් ගොඩනැගිල්ල | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 117.80 | ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 97.90 |
| සේවාදායකයා | කම්කරු දෙපාර්තමේන්තුව | සේවාදායකයා | බෙරුවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| |  | |  |

## කලාප 1 - නඩත්තුව

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි එම්. සත්‍යකුමාර් |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. එස්. උමාකාන්ත් |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 1 - නඩත්තුව) කාර්යාලය,<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>අංක 213<br>ටොරින්ටන් ඇවනියු<br>කොළඹ 07 |
| ☎ **94 11 2582579** | ෆැක්ස් 94 11 2588686 |
| විද්‍යුත් තැපැල | cem@buildingsdept.gov.lk |




### කාර්ය සාධනය

*වගුව 10: ප්‍රධාන ඉංජිනේරු (කලාප 1- නඩත්තු) කාර්යාලයෙ හි නඩත්තු කටයුතු වල සාරාංශය*


| | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | වැඩි දියුණු කිරීම | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 113.20 | 155.21 | 406.41 | **674.82** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 87.00 | 138.71 | 312.39 | **538.10** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 1 | 3 | 116 | **120** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 1 | 1 | 5 | **7** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| රාගම පුනරුත්ථාපන රෝහලේ පවතින ප්‍රධාන මුළුතැන්ගෙය වැඩි දියුණු කිරීම හා නවීකරණය කිරීම | | ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ශ්‍රවණාගාරයේ යෝජිත නවීකරණය | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 24.23 | ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 16.35 |
| සේවාදායකයා | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | සේවාදායකයා | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| |  | |  |

## කලාප 2

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. එස් විනෝදනී මහත්මිය |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. කේ තිරුකුමාර් |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 2) කාර්යාලය, ගොඩනැගිලිදෙපාර්තමේන්තුව, වෙරළ පාර, ගුරුනගර්, යාපනය. |
| ☎ 94 21 2222781 | ෆැක්ස් 94 21 2222781 |
| විද්‍යුත් තැපැල | cej@buildingsdept.gov.lk |




### කාර්ය සාධනය

*වගුව 11: ප්‍රධාන ඉංජිනේරු (කලාප 2) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*


| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 381.17 | 443.34 | 412.79 | **1237.30** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 165.68 | 347.70 | 287.79 | **801.17** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 5 | 13 | 2 | **20** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 10 | 8 | 2 | **20** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| කෘෂිකර්ම පීඨයේ කුසලතා සංවර්ධන මධ්‍යස්ථානය ඉදිකිරීම - යාපනය විශ්ව විද්‍යාලය, කිලිනොච්චිය | | ඉංජිනේරු පීඨය ඉදිකිරීම - යාපනය විශ්ව විද්‍යාලය, කිලිනොච්චිය | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 296.00 | ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 280.00 |
| සේවාදායකයා | *උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය* | සේවාදායකයා | උසස් අධ්‍යාපන සහ පර්යේෂණ අමාත්‍යාංශය |
| |  | |  |

## කලාපය 3

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. ජී.ආර්.එස්.බී. ගම්ලත් |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි.එස්. සුරේන්ද්‍රන් |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 3) කාර්යාලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, විල්ගොඩ පාර, කුරුණෑගල |
| ☎ 94 37 2222197 | ෆැක්ස් 94 37 2222437 |
| විද්‍යුත් තැපැල | cek@buildingsdept.gov.lk |




### කාර්ය සාධනය


*වගුව 12: ප්‍රධාන ඉංජිනේරු (කලාප 3) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | එකතුව |
|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 544.05 | 712.97 | **1257.02** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 395.55 | 279.43 | **674.98** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 29 | 3 | **32** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 15 | 10 | **25** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| පාලවි, නාගවිල්ලුහි වෛද්‍ය නිලධාරී නිල නිවාස ඉදිකිරීම | | පුත්තලම කම්කරු කාර්යාලය ඉදිකිරීම | |
|---|---|---|---|
| **ඇස්තමේන්තු ගත මුළු මුදල** | රුපියල් මිලියන 13.70 | **ඇස්තමේන්තු ගත මුළු මුදල** | රුපියල් මිලියන 63.18 |
| **සේවාදායකයා** | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | **සේවාදායකයා** | කම්කරු දෙපාර්තමේන්තුව |
| |  | |  |

## කලාප 4

| | | |
|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. කේ. ඉලන්කෝ |  |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. එස්. තුෂාන්ති මහත්මිය | |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 4) කාර්යාලය<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>මන්මුනෙයි උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>මඩකලපුව | |
| ☎ 94 63 2224490 | ෆැක්ස් 94 65 2229808 | |
| විද්‍යුත් තැපැල | ceu@buildingsdept.gov.lk | |

### කාර්ය සාධනය

*වගුව 13: ප්‍රධාන ඉංජිනේරු (කලාප 4) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | එකතුව |
|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 583.52 | 565.71 | 178.59 | 18.26 | **1346.08** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 610.04 | 483.85 | 139.35 | 18.26 | **1251.50** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 56 | 15 | 3 | 2 | **76** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 1 | 5 | 10 | - | **16** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| කුච්චවෙලිහි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම | | යෝජිත සේරුනුවර ජාතික යොවුන් සේනාංකය මධ්‍යස්ථානය | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 250.0 | ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 253.0 |
| සේවාදායකයා | වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | සේවාදායකයා | ජාතික යොවුන් සේනාංකය |
| |  | |  |

## කලාප 5



| | | |
|---|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි එන්.එම්.එම්. මරික්කාර් මහත්මිය |  |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි ඩී.සී. විජේසිංහ මහත්මිය | |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාප 5) කාර්යාලය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, මහනුවර | |
| ☎ 94 81223 4255 | ෆැක්ස් 94 81 2234255 | |
| විද්‍යුත් තැපැල | cec@buildingsdept.gov.lk | |





### කාර්ය සාධනය

*වගුව 14: ප්‍රධාන ඉංජිනේරු (කලාප 5) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්පාදන | උපදේශනය | නඩත්තුව | එකතුව |
|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (රුපියල් මිලියන) | 412.74 | 551.78 | 205.51 | **1170.03** |
| මූල්‍ය ප්‍රගතිය (රුපියල් මිලියන) | 239.95 | 328.26 | 158.69 | **726.90** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 4 | 4 | 9 | **17** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 17 | 12 | 4 | **33** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| දඹතැන්න ප්‍රාදේශීය රෝහලේ හදිසි විශේෂ අලුත්වැඩියාවන්, නවීකරණ කටයුතු,එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම | | අංකුඹුර ප්‍රාදේශීය රෝහලේ බාහිර රෝගී අංශය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 31.91 | ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 46.30 |
| සේවාදායකයා | සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | සේවාදායකයා | මධ්‍යම පළාත් සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| |  | |  |

## කලාපය 6

| | |
|---|---|
| ප්‍රධාන ඉංජිනේරු | ඉංජි. කේ. ලියනගේ මහත්මිය |
| නියෝජ්‍ය ප්‍රධාන ඉංජිනේරු | ඉංජි කේ.පී.ඒ. ගුණවර්ධන |
| කාර්යාලය | ප්‍රධාන ඉංජිනේරු (කලාපය 6) කාර්යාලය<br>ගොඩනැගිලි දෙපාර්තමේන්තුව,<br>අංක 10, ඉහළ ඩික්සන් පාර,<br>ගාල්ල. |
| ☎ 94 91 223 4838 | ෆැක්ස් 94 91 223 4838 |
| විද්‍යුත් තැපැල | ceg@buildingsdept.gov.lk |




### කාර්ය සාධනය

*වගුව 15: ප්‍රධාන ඉංජිනේරු (කලාප 6) කාර්යාලයෙ හි ප්‍රගතියේ සාරාංශය*

| | කාර්ය නිෂ්ඨාව | උපදේශනය | ව්‍යාපෘති කළමනාකරණය | නඩත්තුව | ප්‍රතිසංස්කරණය | එකතුව |
|---|---|---|---|---|---|---|
| මූල්‍ය ඉලක්කය (මිලියන) | 102.70 | 151.03 | 584.10 | 14.62 | 0.50 | **852.95** |
| මූල්‍ය ප්‍රගතිය (මිලියන) | 77.29 | 149.78 | 421.80 | 13.12 | 0.31 | **662.30** |
| සම්පූර්ණ කළ ව්‍යාපෘති (ගණන) | 7 | 2 | 6 | 5 | 2 | **22** |
| සිදු කෙරෙමින් ඇති ව්‍යාපෘති (ගණන) | 8 | 52 | 26 | 1 | - | **87** |

### සම්පූර්ණ කළ ව්‍යාපෘති

| රිදියගම සාෆාරි උද්‍යානයේ සේවක නිල නිවාස ඉදිකිරීම (නිවස්න සමූහ - ඒ) | | ගාල්ල තාක්ෂණික විද්‍යාලයේ පිවිසුම් දොරටුව, පාපැදි නැවතුම ඉදිකිරීම සහ ඉදිරිපස පෙනුම වැඩි දියුණු කිරීම | |
|---|---|---|---|
| ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන21.06 | ඇස්තමේන්තු ගත මුළු මුදල | රුපියල් මිලියන 19.5 |
| සේවාදායකයා | සත්ව විද්‍යා දෙපාර්තමේන්තුව | සේවාදායකයා | නිපුණතා සංවර්ධන සහ වෘත්තීය පුහුණු අමාත්‍යාංශය |
| |  | |  |

## මානව සම්පත්

*වගුව 16: 31.12.2017 දිනට සේවක සංඛ්‍යා විස්තර*

| කළමනාකරණ කාර්ය මණ්ඩලය | අනුමත | පවතින | පුරප්පාඩු | මෙහෙයුම් කාර්ය මණ්ඩලය | අනුමත | පවතින | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | 1 | 1 | 0 | ජ්‍යෙෂ්ඨ වාස්තු විද්‍යාඥ | 2 | 0 | 2 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා) | 1 | 1 | 0 | වාස්තු විද්‍යාඥ | 10 | 10 | 0 |
| අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශක සේවා) | 1 | 0 | 1 | අභ්‍යන්තර නිර්මාණවේදී | 2 | 0 | 2 |
| අධ්‍යක්ෂ (ඉදිකිරීම්) | 3 | 3 | 0 | පරිපාලන නිලධාරී | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ) | 1 | 1 | 0 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරි | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) (වැඩ බලන) | 1 | 1 | 0 | කාර්මික නිලධාරී | 94 | 68 | 26 |
| අධ්‍යක්ෂ (පාලන) | 1 | 1 | 0 | ප්‍රමාණ සමීක්ෂණ සහකාර | 13 | 13 | 0 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 | සැලසුම් ශිල්පි | 40 | 29 | 11 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 | සංවර්ධන නිලධාරී | 37 | 35 | 2 |
| නියෝජ්‍ය/ සහකාර අධ්‍යක්ෂ (පාලන) | 1 | 0 | 1 | තාක්‍ෂණ සහකාර | 40 | 0 | 40 |
| ප්‍රධාන ඉංජිනේරු | 14 | 9 | 5 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර | 2 | 1 | 1 |
| ප්‍රධාන ඉංජිනේරු (යාන්ත්‍රික) | 1 | 0 | 1 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 80 | 49 | 31 |
| ඉංජිනේරු | 70 | 39 | 31 | වෙනත් | 178 | 161 | 17 |
| ගණකාධිකාරී | 5 | 4 | 1 | | | | |
| **එකතුව** | **102** | **62** | **40** | **එකතුව** | **500** | **366** | **134** |
| **අනුමත සේවක සංඛ්‍යාව** | **602** | **දැනට සිටින සේවක සංඛ්‍යාව** | | **428** | **පුරප්පාඩු** | | **174** |

## මානව සම්පත්-ශක්තිය

දෙපාර්තමේන්තුව සතු අතිමහත් ශක්තිය වන්නේ සිවිල්, විද්‍යුත් සහ යාන්ත්‍රික ක්ෂේත්‍රයන් ගේ වරලත් ඉංජිනේරුවරුන් සහ වරලත් වාස්තු විද්‍යාඥයන්, අභ්‍යන්තර නිර්මාණ ශිල්පීන් සහ තාක්ෂණික කාර්ය මණ්ඩලය යනාදී බහු වෘත්තික කාර්ය මණ්ඩලයයි.

ප්‍රධාන ඉංජිනේරුවන් 09ක්, ඉංජිනේරුවන් 39ක්, වාස්තු විද්‍යාඥයින් 10, තාක්ෂණ නිලධාරීන් 68, සැලසුම් ශිල්පීන් 29 ක් හා ප්‍රමාණ සමීක්ෂණ සහකරුවන් 13ක ගෙන් සමන්විත බහු ව්‍යාපෘති කාර්ය මණ්ඩලය ලෙස යොදා ගනිමින් දෙපාර්තමේන්තුව තම සේවය ලබා දෙයි.

ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත වැඩකටයුතුවල උපදේශන ආයතනය සහ පූර්ණ බලාධිකාරිය ලෙස මෙම වෘත්තීය කණ්ඩායම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී  සහ ඒවායේ නීතිමය කටයුතු සම්බන්ධයෙන් විශේෂඥ උපදෙස් ලබාදීම සඳහා කැඳවනු ලබයි.

ඵලදායී සහ දූරදර්ශී නායකත්වය, සේවකයන් අතර සහයෝගය වැඩි කර ඉලක්ක සැපිරීම සඳහා සම්පත් යොදාගනිමින් ජයග්‍රහණ කරා ළඟා වීමට ඉවහල් වෙයි. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව හැකියාවෙන් පිරි, ස්ථාවර සහ සක්‍රිය නායකත්වයක් ලැබීමේ භාග්‍යය උදාකරගෙන ඇති අතර, ඔවුන් නොමැතිනම් ප්‍රගතිය සිහිනයක් වනු ඇත.

මෙහි පවතින එකම තර්ජනය වන්නේ පුද්ගලික සහ වෙනත් අංශයන්හි පවතින ආකර්ෂණය හේතුවෙන් තාක්ෂණික කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුව හැර යාමයි.

සියලුම පුරප්පාඩු සපුරා ඇතිනම්, සංවිධානයේ වර්ධනය, කාර්යක්ෂමතාවය සහ ඵලදායීතාව මෙන්ම සේවාව සැපයීමේ ආකාරය ද මෙයට වඩා ඉදිරියෙන් තිබෙනු ඇත.

### සේවක සංඛ්‍යාව

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 602 ක් වන අතර පවතින සේවක සංඛ්‍යාව 428 කි. ඒ අනුව පුරප්පාඩු සංඛ්‍යාව 174 කි.  පුරප්පාඩු සංඛ්‍යාව සැලකීමේ දී ඒ අතර 43 ක් දීප ව්‍යාප්ත සේවාවලට අයත් වේ. කෙසේ වෙතත් සංවිධානයේ වර්ධනය උදෙසා විශේෂයෙන්ම දෙපාර්තමේන්තු ගත තනතුරු පුරප්පාඩු සහ අනෙක් පුරප්පාඩු සියල්ල පිරවීමට උත්සහ ගන්නා ලද අතර 2017 වසරේදී එම දෙපාර්තමේන්තු ගත තනතුරු පිරවීමට සිදු කළ බඳවා ගැනීම් වගුව 17 මගින් පෙන්වා ඇත.

*වගුව 17: 31.12.2017 දිනට දෙපාර්තමේන්තුගත තනතුරු සඳහා වන පුරප්පාඩු පිරවීම*

| තනතුර | ලැබුණු අයදුම්පත් සංඛ්‍යාව | සුදුසුකම් ලැබූ අයදුම්පත් සංඛ්‍යාව | විභාගය සමත් වූ අයදුම්කරුවන් ගණන | සම්මුඛ පරීක්ෂණයට බඳුන් කළ අයදුම්කරුවන් ගණන | බඳවාගත් අයදුම්කරුවන් ගණන |
|---|---|---|---|---|---|
| කාර්මික නිලධාරි | 238 | 177 | 65 | 65 | 19 |
| කම්කරුවන් | 182 | 176 | - | 176 | 35 |
| රියැදුරන් | 49 | 28 | - | 07 | 04 |
| තාක්ෂණ සහකාර | 518 | 356 | 141 | 141 | කටයුතු කරමින් සිටී |
| සැලසුම් ශිල්පීන් | 244 | 89 | 14 | කටයුතු කරමින් සිටී | කටයුතු කරමින් සිටී |

## ධාරිතා සංවර්ධනය

සේවක සංඛ්‍යාවේ දැනුම වර්ධනය දීර්ඝකාලීනව ඉතා වැදගත් කාර්යයක් වන අතර පහත වගුව 18 මගින් 2017 වසරේදී පැවැත්වූ පුහුණු වැඩසටහන්වල විස්තර සහ පුහුණුව ලත් නිලධාරීන් ගණන පෙන්නුම් කෙරේ.

*වගුව 18: 2017 වසරේදී පැවැත්වූ පුහුණු වැඩසටහන් වල විස්තර සහ පුහුණුව ලත් නිලධාරීන් ගණන*

| අංකය | පුහුණු වැඩසටහනේ නම | ආයතනය/ සම්පත්දායකයා | පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව | නිලධර කාණ්ඩය | මුළු පිරිවැය (රුපියල්) |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රමාණ සමීක්ෂණය පිළිබඳ සහතික පත්‍රය | CHPB | 01 | කාර්මික නිලධාරීන් | 30,000.00 |
| 2 | කාර්යාල කළමනාකරණය සහ මූල්‍ය රෙගුලාසි | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 6,000.00 |
| 3 | කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | CIDA | 01 | ඉංජිනේරු | 60,000.00 |
| 4 | ඉහළ ශ්‍රම ඵලදායිතාවක් සඳහා කාර්යාල කාර්ය සහායකයන්ගේ කාර්ය භාරය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 06 | කාර්යාල කාර්ය සහායක | 18,000.00 |
| 5 | නිවාඩු විෂය භාර නිලධාරියාගේ කාර්ය භාරය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 3,000.00 |

| අංකය | පුහුණු වැඩසටහනේ නම | ආයතනය/ සම්පත්දායකයා | පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව | නිලධර කාණ්ඩය | මුළු පිරිවැය (රුපියල්) |
|---|---|---|---|---|---|
| 6 | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | මොරටුව විශ්ව විද්‍යාලය | 02 | වාස්තු විද්‍යාඥ | 300,000.00 |
| 7 | ජලනල ඉංජිනේරු ක්‍රමය පිළිබඳ CPD පාඨමාලාව | ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය | 02 | ඉංජිනේරු | 77,000.00 |
| 8 | වත්කම් කළමනාකරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 02 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 12,000.00 |
| 9 | ඵලදායී පුද්ගලික ගොනු කළමනාකරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර/සංවර්ධන නිලධාරි | 30,000.00 |
| 10 | ගිණුම් පරිචය ප්‍රායෝගිකව භාවිතා කිරීම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 10 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 54,000.00 |
| 11 | රියැදුරන්ගේ හැකියා සංවර්ධනය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 02 | රියැදුරන් | 12,000.00 |
| 12 | ඉංජිනේරුවන්ගේ වාර්ෂික සැසිවාර | IESL | 02 | ඉංජිනේරුවන් | 8,000.00 |
| 13 | සැලසුම් ශිල්පීන් සඳහා වන පුහුණු වැඩසටහන | දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය | 18 | සැලසුම් ශිල්පි<br>සැලසුම් ශිල්පි (පුහුණු කිරීමේ ශ්‍රේණිය) | - |
| 14 | ඉංජිනේරුවන්, තාක්ෂණික නිලධාරීන් සහ ප්‍රමාණ සමීක්ෂණයන් සඳහා වන පුහුණු වැඩසටහන | දෙපාර්තමේන්තු ශ්‍රවණාගාරය | 27 | ඉංජිනේරුවන්, කාර්මික නිලධාරීන් සහ ප්‍රමාණ සමීක්ෂණ සහකාර | - |
| 15 | රාජ්‍ය ප්‍රසම්පාදන සහ ගිවිසුම් පරිපාලනය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව | SLIDA | 01 | ඉංජිනේරු | 120,000.00 |
| 16 | අකුණු ආරක්ෂණය පිළිබඳ CPD පාඨමාලාව | IESL | 01 | ඉංජිනේරු | 12,500.00 |
| 17 | ප්‍රායෝගික සීමිත සංරචක විශ්ලේෂණය පිළිබඳ අඛණ්ඩ වෘත්තීය සංවර්ධන පාඨමාලාව | IESL | 02 | ඉංජිනේරු | 40,000.00 |

| අංකය | පුහුණු වැඩසටහනේ නම | ආයතනය/සම්පත්ද ායකයා | පුහුණු කළ නිලධාරීන් සංඛ්‍යාව | නිලධර කාණ්ඩය | මුළු පිරිවැය (රු) |
|---|---|---|---|---|---|
| 18 | පරිගණක දෘඩාංග සහ ජාලකරණය පිළිබඳ ඩිප්ලෝමාව | තරුණ සේවා සභාව | 01 | තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර | 30,000.00 |
| 19 | මූලික ගබඩා කළමනාකරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 05 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 15,000.00 |
| 20 | මානව සම්පත් කළමනාකරුවෙකුගේ කාර්ය භාරය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 09 | | 24,000.00 |
| 21 | රාජ්‍ය නිලධාරීන්ගේ වැටුප් සැකසීම | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 04 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 12,000.00 |
| 22 | විකල්ප මතභේද නිරාකරණ ක්‍රම සහ දේශීය ඉදිකිරීම් කොන්ත්‍රාත් තුළ හොඳම පරිචයන් | CIDA | 08 | ඉංජිනේරුවන් | 32,000.00 |
| 23 | රියැදුරන් සඳහා වැඩමුළු | CETRAC | 05 | රියැදුරන් | 18,000.00 |
| 24 | ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ CPD පාඨමාලාව | IESL | 01 | ඉංජිනේරුවන් | 22,000.00 |
| 25 | ඵලදායිතාව සඳහා බලශක්ති කාර්යක්ෂමතාවය පිළිබඳ වැඩමුළුව | ඵලදායිතා ලේකම් කාර්යාලය | 02 | සංවර්ධන නිලධාරීන් | 10,000.00 |
| 26 | වාහන සහ යන්ත්‍ර සූත්‍ර කළමනාකරණය | ජාතික ශ්‍රම අධ්‍යයන ආයතනය | 02 | ඉංජිනේරු | 40,000.00 |
| 27 | ස්නායු භාෂාමය (Neuro Linguistic) පුහුණු වැඩසටහන | මයින්ඩ් ඩිසයින්ස් ඉන්ටර්නැෂනල් | 61 | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන්, රාකස,සං.නි | 185,000.00 |
| 28 | ඔබව සන්නාම කර ගැනීම (Branding Your-self) පිළිබඳ පුහුණු සැසිය | ප්‍රසන්න පෙරේරා මහතා | 31 | මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරීන් | 10,000.00 |

## ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ ප්‍රකාශය

### අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණන අංශය ස්ථාපිත කරනු ලැබුයේ 2015 ජූනි මසදීය.

**අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන අරමුණ -**

මුදල් රෙගුලාසි 133 යටතේ අභ්‍යන්තර විගණන අංශ සඳහා වූ ප්‍රධාන පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වාර්ෂිකව විගණන සැලසුම් සකස් කර, අනාවරණය වන කරුණු අනුව අභ්‍යන්තර පාලන පද්ධති හඳුන්වා දීම හා ආයතන සංග්‍රහයේ II වන කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 29 වැනි ඡේදය අනුව කටයුතු කිරීම.

*වගුව 19: කාර්ය මණ්ඩලය*

| අනු.අංකය | තනතුර | නම |
|---|---|---|
| 1 | ප්‍රධාන අභ්‍යන්තර විගණක | එස්. නරසිංහ මෙය |
| 2 | සංවර්ධන නිලධාරී | කේ.ජී.එස්. ප්‍රියදර්ශනී |
| 3 | රාජ්‍ය කළමනාකරණ සහකාර- I | ජයන්ත රුදිගු මහතා |
| 4 | රාජ්‍ය කළමනාකරණ සහකාර III | කේ.එල්.ඩී.එම්. අමරසිංහ |
| 5 | කාර්යාල සහායක | ඒ.ඒ. ගාමිණී තිලක් මහතා |

**අභ්‍යන්තර විගණන වාර්තාව -2017**

1. 2017 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටුවට ඉදිරිපත් කරන ලද අභ්‍යන්තර විගණන සැලසුම, නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම් හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලදී.
2. විගණක විසින් ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් වෙත වාර්තා 87 ක් ඉදිරිපත් කරනු ලැබ ඇත. මූල්‍ය රෙගුලාසි 134 (3) අනුව, මසකට වරක් මෙම වාර්තාවල පිටපත් නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයේ ලේකම්වරයාට සහ විගණකාධිපතිවරයාට යවනු ලැබේ.
3. සමාලෝචිත වර්ෂය තුළදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර හතරක් පවත්වා ඇත.
4. ඊට අමතරව වගුව 20 මගින් දක්වා ඇති විෂයන්ට අනුකූලව වාර්තා ඉදිරිපත් කර ඇති අතර, වාර්තා ප්‍රමාණයද ඉදිරියෙන් දක්වා ඇත.

*වගුව 20*

| අනු.අංකය | මාතෘකාව | සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නීති-රීති රෙගුලාසි වලට අනුකූල නොවීම | 38 |
| 2 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් පරීක්ෂාව | 01 |
| 3 | අධ්‍යක්ෂ ජනරාල් පෞද්ගලික ගිණුම් පරීක්ෂාව | 02 |
| 4 | පද්ධති අධීක්ෂණය | 12 |
| 5 | වත්කම් පරීක්ෂා කිරීම් | 04 |
| 6 | කලාප ප්‍රධාන ඉංජිනේරු කාර්යාල පරීක්ෂාව | 08 |
| 7 | විශේෂ විමර්ශන | 02 |
| 8 | ව්‍යාපෘති ගෙවීම් පරීක්ෂාව | 22 |

# විගණකාධිපති වාර්තාව

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියලුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියලු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරියා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත්

කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 අගෝස්තු 23 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේ දී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටු කිරීමේ දී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරි වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු කර තිබුණු බව නිරීක්ෂණය විය.

| මුදල් රෙගුලාසි 128(1) ප්‍රකාර ගණන්දීමේ නිලධාරිගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරී එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| මුදල් රෙගුලාසි | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූලා ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම අමාත්‍යාංශයේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. කාර්යයන් ඉටු නොකිරීම.<br>2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම. | 2.2.1<br>2.2.2 |
| 128(1) (ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම අමාත්‍යාංශයේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව | අනුකූල නොවීම | 2.7 |
| 128(1) (ඉ) | රජය සතු වූ හෝ රජය භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාපනය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශනය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශනය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව | වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 |

| | | | |
|---|---|---|---|
| 128(1) (උ) | හිඟව තිබෙන ශාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවරී ඇති නිලධාරින් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුමේ හිඟහිටි ණය ශේෂ අයකර නොගැනීම | 2.6 |
| 128(1) (එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව (මෙහිලා අරපිරිමැස්ම යනුවෙන් අදහස් කෙරෙන්නේ හුදෙක් ඇස්තමේන්තුමත වියදම් දැරීම නොව, වියදම් කරනු ලබන මුදල දරනා රජයට උපරිම වටිනාකම ලැබෙන බවට සහතික කිරීම) | වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම. | 2.5 |
| 128(1) (ඡ) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් / සේවකයන් මත අධිභාර පනවනු ලබන බව (වගබලා ගැනීම පිණිස ප්‍රමාණවත් විධිවිධාන යෙදීම විශේෂයෙන් ඔහුගේ යුතුකම් භාරය වන්නේය.) | පිරිවැය හා කාර්යක්ෂමතාවයකින් තොරව වත්කම් අපහරණය කිරීම. | 2.3 (ඇ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 2.1 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

(අ) රජයේ දෙපාර්තමේන්තු ආයතනශ සහ අනෙකුත් රාජ්‍යඅමාත්‍යාං , සඳහා ගොඩනැගිලි සහ අනෙකුත් සේවාවන්ට අවශ්‍ය සැලසුම් සැකසීම ඇස්තමේන්තු සැකසීම සහ ඉදිකිරීම.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් රාජ්‍ය ආයතන සඳහා උපදේශාත්මක සේවාවන් සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම

(ඇ) රජයේ දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශවල ගොඩනැගිලි නඩත්තු කටයුතු අළුතින් එකතු කිරීම හා වැඩිදියුණු කිරීමේ කාර්යයන් ඉටුකිරීම.

(ඈ) ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම සහ පුනරුත්ථාපන කාර්යයන් ඉටුකිරීම .

### 2.2 කාර්යසාධනය

#### 2.2.1 කාර්යයන් ඉටුනොකිරීම

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබූ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් සහ පුනරුත්ථාපන කාර්යන් ඉටු කිරීම දක්වා තිබුණද දෙපාර්තමේන්තුව විසින් එය සිදු කර නොතිබුණි.

#### 2.2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබන සියලුම කොන්ත්‍රාත්තු උප කොන්ත්‍රාත් ක්‍රමයට කිරීම සඳහා විවිධ කොන්ත්‍රාත්කරුවන් වෙත ලබා දී තිබුණි. දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂය තුළ ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,847.92 ක් වූ Turnkey ඉදිකිරීම් කොන්ත්‍රාත් ව්‍යාපෘති 142 ක් දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර තිබූ අතර ඒ සියල්ල උප කොන්ත්‍රාත් ක්‍රමයට ඉටු කර තිබුණි. මෙම ව්‍යාපෘති අතුරින් 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය නිමකළ යුතු ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 57.56 ක් වූ ව්‍යාපෘති 11 ක කිසිදු කාර්යයක් ඉටු කර නොතිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 287.27 ක් වූ ව්‍යාපෘති 11 ක කාර්යසාධනය සියයට 10 සිට සියයට 30 දක්වා වූ පරාසයක අඩු මට්ටමක තිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

### (අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්

දෙපාර්තමේන්තුවට අයත් ටොරින්ටන් ප්‍රදේශයේ පිහිටි ගොඩනැගිල්ලක් ස්වදේශ කටයුතු අමාත්‍යාංශයට අසම්පූර්ණ ගිවිසුමක් මගින් 2016 මැයි මස පවරා තිබූ අතර එහි තක්සේරුව නිසි ලෙස සිදු නොකිරීම නිසා කුලී අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

### (ආ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ විවිධ ප්‍රදේශවල පිහිටි කාර්යාල නිල නිවාස හා සංචාරක බංගලා ආදිය පවත්වාගෙන යනු ලබන ඉඩම් කැබලි 40 ක් අතුරින් 30 ක හිමිකාරිත්වය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සතුව නොමැති බව හඳුනාගෙන තිබූ අතර හිමිකාරිත්වය දෙපාර්තමේන්තුව සතුව පවතින බව හඳුනාගත් ඉඩම් 04 ක් සම්බන්ධයෙන් ඔප්පු ලබා ගෙන නොතිබුණි.

### (ඇ) බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

දෙපාර්තමේන්තුව විසින් ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ විවෘත කර ඇති රු.781,035 ක ආරම්භක ශේෂයක් සහිත ඇප තැන්පත් හා විවිධ තැන්පත් ගිණුම් 419 ක් දීර්ඝ කාලයක සිට අක්‍රියව පැවතුණි.

### (ඈ) වාහන අපහරණය නොකිරීම

2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12 වගන්තිය පරිදි සෑම වසරකට වරක්ම අපහරණය කළ යුතු වාහන හඳුනාගෙන වාහන අපහරණ ක්‍රියාවලිය සිදු කළ යුතු වුවත් ධාවනයෙන් ඉවත් කර වසරකට වැඩි කාලයක් ඉකුත්ව තිබූ වාහන 02 ක් සම්බන්ධයෙන් 2017 දෙසැම්බර් 31 දින වන විට එසේ පියවර ගැනීම ප්‍රමාද වී තිබුණි.

## 2.4 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීම

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුළ දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු හා ඒ පිළිබඳ විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු. මිලියන | රු.මිලියන | රු. මිලියන | % |
| 2013 | පුනරාවර්තන | 239.32 | 229.66 | 9.66 | 4.04 |
| | මූලධන | 42.99 | 25.36 | 17.63 | 41.01 |
| | **එකතුව** | **282.31** | **255.02** | **27.29** | **9.67** |
| 2014 | පුනරාවර්තන | 250.05 | 248.07 | 1.98 | 0.79 |
| | මූලධන | 48.56 | 48.47 | 0.09 | 0.19 |
| | **එකතුව** | **298.61** | **296.54** | **2.07** | **0.69** |
| 2015 | පුනරාවර්තන | 292.90 | 286.73 | 6.17 | 2.11 |
| | මූලධන | 52.40 | 52.23 | 0.17 | 0.32 |
| | **එකතුව** | **345.30** | **338.96** | **6.34** | **1.84** |
| 2016 | පුනරාවර්තන | 315.54 | 308.99 | 6.55 | 2.08 |
| | මූලධන | 37.50 | 36.37 | 1.13 | 3.01 |
| | **එකතුව** | **353.04** | **345.36** | **7.68** | **2.18** |
| 2017 | පුනරාවර්තන | 316.24 | 316.06 | 0.18 | 0.61 |
| | මූලධන | 39.90 | 38.91 | 0.99 | 2.48 |
| | **එකතුව** | **356.14** | **354.97** | **1.17** | **0.33** |

### 2.5 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

ඉදිකිරීම් කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 13 ක් හා දෙපාර්තමේන්තු 11 ක් විසින් එකතුව රු.මිලියන 2,204.67 ක් වූ ප්‍රතිපාදන දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,189.17 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි. ඒ අනුව රු.මිලියන 1,015.50 ක් හෙවත් සියයට 46.06 ක ප්‍රතිපාදන 2017 දෙසැම්බර් 31 දිනට ඉතිරි වී තිබුණි.

### 2.6 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

#### පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 30901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | කථ්‍ය | අවම සීමාව | කථ්‍ය | උපරිම සීමාව | කථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 26.00 | 25.44 | 13.50 | 14.86 | 90.00 | 58.15 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

මියගිය නිලධාරියෙකුගේ ණය ශේෂය වූ රු.145,850 ක් වසරකට වැඩි කාලයක සිට පවතින අතර එය නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටද කටයුතු කර නොතිබුණි.

## 2.7 නීතිරීති රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2016 ජනවාරි 01 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 06(i) , (ii) සහ 07 යන ඡේදවල දක්වා ඇති උපදෙස් ප්‍රකාරව සෑම කාර්තුවක් අවසානයේ එළඹෙන මස 15 වන දිනට ප්‍රථමව කාර්තුව තුළදී අලුතින් එකතුවූ වාහන, වාහන අපහරණය කිරීම්, වාහන හුවමාරු කිරීම් ඇතුළු වෙනත් වෙනස්වීම් පිළිබඳ තොරතුරු කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට යැවිය යුතු අතර, වෙනසක් නොමැති නම් හිස් වාර්තාවක් හෝ යැවිය යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එසේ කටයුතු කර නොතිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා කථ්‍ය සේවක සංඛ්‍යාව

ඉහත 2.1 ඡේදයේ සඳහන් කාර්යභාරය ඉටුකිරීම සඳහා 2017 දෙසැම්බර් 31 දිනට කථ්‍ය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 124 | 81 | 43 | - |
| (ii) | තෘතියික මට්ටම | 24 | 4 | 20 | - |
| (iii) | ද්විතියික මට්ටම | 285 | 231 | 54 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 178 | 159 | 19 | - |
| (v) | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | - | 20 | - | 20 |
| | **එකතුව** | **611** | **495** | **136** | **20** |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පුරප්පාඩු 136 ක් පිරවීමට දෙපාර්තමේන්තුව මේ දක්වාම කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ කාර්යසාධනයට සෘජු බලපෑමක් කරන අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන සේවා) තනතුර 2016 ඔක්තෝබර් මස සිට පුරප්පාඩු වී තිබුණි.